සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/ER/සමෘද්ධි ගෙවතු
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2020.06.04

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමණාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරීන්.

## ගෙවතු වගා ජාතික වැඩසටහන - 2020 මහ කන්නය

ආර්ථික පුනර්ජීවණය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය මඟින් 2020 මහ කන්නයේ ගෙවතු වගා ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව වූ සාකච්ඡාවක් 2020.06.01 දින පවත්වන ලදී.

02. එහිදී සාකච්ඡාවට බඳුන් වූ කරුණු හා ගන්නා ලද තීරණ ඔබ වෙත ඉදිරිපත් කරන අතර ඒ අනුව මෙම වැඩසටහන ඔබ දිස්ත්‍රික්කයේ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. ආර්ථික පුනර්ජීවණය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්යසාධන බලකායේ කාර්ය පැවරුම් ගැසට් පත්‍රයට අනුව පහත සඳහන් කරුණු ප්‍රමුඛ අරමුණු ලෙස සඳහන් කර ඇති බැවින් මෙම වැඩසටහනේදී පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම අත්‍යාවශ්‍ය වනු ඇත.

i. දේශීය ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමට ගෙවතු හිමියන් දිරිගැන්වීම හා ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීම.
ii. දේශීය ආහාර සුරක්ෂිතභාවය සඳහා වී,ධාන්‍ය, එළවළු,පලතුරු,මාළු,මස්, කිරි හා බිත්තර නිෂ්පාදන ගොවිපල කටයුතු සඳහා ගොවීන්ට පහසුකම් සැපයීම.
iii. රජයේ සහ පෞද්ගලික බීජ හා පැල තවාන්කරුවන් දිරිගැන්වීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය බීජ, පැලැටි, පොහොර,උපකරණ ලබාදීමට අදාල ආයතන මෙහෙයවීම සහ අවශ්‍ය පහසුකම් සැපයීම.
iv. Covid 19 වසංගත තත්ත්වය නිසා ජාත්‍යන්තර හා ජාතික වශයෙන් ඇති වූ ආහාර සුරක්ෂිතතාවයේ වැදගත්කම නිසා ජනතාව ගෙවතු වගා සඳහා ප්‍රවිශ්ඨ වී ඇති බැවින් මෙම සහභාගීත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා රජයේ සහයෝගය ලබාදීම.
v. ඉදිරි මහ කන්නයේදී මෙම වැඩසටහන තිරසර ලෙස සැලසුම් කළ ගෙවත්තක් තුළින් පවුලේ දෛනික පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887 |
| | | Hot Line :0112-889007 | | | |

04. මෙම කටයුතු සාර්ථක කර ගැනීමට සිදු කළ යුතු කාර්යයන්, එම කාර්යයන් ඉටු කිරීමේ වගකීම පවරා ඇති විවිධ ආයතන සහ ඉටු කළ යුතු දිනයන් පිළිබඳව උක්ත රැස්වීමේදී තීරණය විය. (ඇමුණුම- 01) එහිදී සකස් කරන ලද මෙම වැඩසටහනට අදාල ක්‍රියාත්මක සැලැස්ම ද මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරමි. (ඇමුණුම-02) මෙම ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමේදී වගකීම් පවරා ඇති ආයතන සමඟ නිරතුරු සම්බන්ධ වෙමින් මෙම වැඩසටහන සාර්ථක කර ගත යුතු වේ.

05. එමෙන්ම ගෙවතු වගාවන් සඳහා අවශ්‍ය පැල වර්ග සපයාදීම ප්‍රධාන වශයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර මේ සම්බන්ධයෙන් දැනටමත් ඔබ වෙත දන්වා ඇති පරිදි එක් ග්‍රාම නිලධාරී වසමකින් අවම වශයෙන් එක් පැල තවානක් හෝ ආරම්භ කළ යුතුවේ. දැනටමත් පැල තවාන් පවත්වාගෙන යන ප්‍රතිලාභීන් හෝ අළුතින් පැල තවානක් ආරම්භ කිරීමට සුදුසු ප්‍රතිලාභීන් හඳුනාගෙන ඒ පිළිබඳ තොරතුරු මේ සමඟ ඇති ආකෘතියට අනුව (ඇමුණුම-03) jeevonopaya@gmail.com යන විද්‍යුත් තැපැල ඔස්සේ ලබා දෙන මෙන් කාරුණිකව දන්වමි.

06. උචිත සහ ඉල්ලුම පවතින එළවළු, පළතුරු මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ශාක පැල වර්ග ඇති කිරීමට පැල තවාන් හිමියන් උනන්දු කරවීම වැදගත් වන අතර මෙහිදී කෙටිකාලීන හා ස්ථිර බෝග යන ඕනෑම වර්ගයක පැල කෙරෙහි අවධානය යොමු කිරිම සුදුසුවේ. එමෙන්ම එම පැල උපරිම සාධාරණ මිලකට ප්‍රතිලාභී ජනතාව වෙත ලබාදීමට හැකි හා තිරසාර ලෙස පැල තවාන පවත්වාගෙන යා හැකි අයවලුන් මේ සඳහා තෝරා ගන්නා මෙන් කාරුණිකව දන්වමි. පැල තවාන් සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන දැනට ක්‍රියාත්මක 5% වාර්ෂික පොළී අනුපාතය යටතේ සමෘද්ධි බැංකුවේ ජීවනෝපාය චක්‍රිය අරමුදල මඟින් රු. 50,000/- උපරිමයකට යටත්ව ණය මුදලක් ලෙස ලබාදිය හැකිය.මීට වඩා මුදල් අවශ්‍ය අයවළුන් සඳහා සමෘද්ධි බැංකු සංගම් මඟින් ලබාදෙනු ලබන අවම පොළී අනුපාතයන් මත අවශ්‍ය ණය ලබාදිමට කටයුතු කළ යුතු වේ.

07. කඩිනමින් මෙම වැඩසටහන ආරම්භ කළයුතු බැවින් පැල තවාන් දැනට පවත්වාගෙන යන පුද්ගලයින් පිළිබඳව තොරතුරු හා පැල තවාන් නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාශයන්හි සුදුසු පුද්ගලයින් හඳුනාගෙන ඔවුන්ගේ තොරතුරු ලබාදීමටත් පැල තවාන් වලින් ගෙවතු වගාවන් සඳහා අවශ්‍ය පැල වර්ග සපයාදීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

08. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශයෙන් (දුරකථන අංක 011-2873801) ලබා ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 1. ජනාධිපති ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ
2. ලේකම් - කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
3. කම්ටු ප්‍රධානී - ග්‍රාමීය ආර්ථිකය,ආර්ථික පුනර්ජීවණය හා දරිද්‍රතා තුරන්කිරීම පිළිබඳ ජනාධිපති කාර්යය සාධන බලකාය.
4. රාජ්‍ය ලේකම් - සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
5. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව
6. ප්‍රධාන ගණකාධිකාරි - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
8. සියළුම අංශ ප්‍රධානීන් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

කා.දැ.ගැ.පි.